ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2018 ජුනි 28 |

**දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනු ලබන්නේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවයි**

2007 වසරේ සිට දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) ඇස්තමේන්තු සම්පාදනය කිරීමේ පූර්ණ වගකීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. එසේ වුවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද.දේ.නි. ඇස්තමේන්තු වෙනස් කරන ලද බවට සාමාන්‍ය ජනතාව නොමග යවමින් ඇතැම් පාර්ශ්ව විසින් ප්‍රකාශයන් මාධ්‍ය වෙත නිකුත් කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත.

2006 වසර දක්වා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව ද ද.දේ.නි. ඇස්තමේන්තු සම්පාදනය කර ප්‍රකාශයට පත් කිරීම සිදු කරන ලදී. එසේ වුවද, ස්වාධීන ආයතනයක් විසින් දත්ත සම්පාදනය කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් 2007 වසරේ සිට ද.දේ.නි. ඇස්තමේන්තු සම්පාදනය කිරීමේ පූර්ණ වගකීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත පැවරෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද.දේ.නි. ඇස්තමේන්තු සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය අත්හිටුවන ලදී. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ද.දේ.නි. ඇස්තමේන්තු සම්පාදනය කිරීමට අමතරව පාරිභෝගික මිල දර්ශක, ශ්‍රම බලකාය, දරිද්‍රතාව ආදී ක්ෂේත්‍ර වලට අදාළ දත්ත අන්තර්ජාතිකව පිළිගත් ක්‍රමවේදවලට අනුකූලව ගණනය කිරීමේ වගකීම දරමින් දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව තවදුරටත් මෙවැනි දත්ත පරිශීලනය කරන ප්‍රධාන ආයතනයක් ලෙස එම දත්ත ආර්ථික විශ්ලේෂණ සහ මුදල් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා යොදා ගනී.

එහෙයින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද.දේ.නි. ඇස්තමේන්තු වෙනස් කරන ලදැයි කරනු ලබන චෝදනා මුළුමනින්ම පදනම් විරහිත වේ.